# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 2171635 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1722 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 17/11/2024<br>පැය 1720 |


**මාධ්‍ය නිවේදනය**

**අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් 04 දෙනෙකු සම්බන්ධව - මට්ටක්කුලිය පොලිස් ස්ථානය**

2024.11.16 වන දින රාත්‍රී කාලයේ ස්ථානාධිපති මට්ටක්කුලිය විසින් වසම තුල සංචාරය කරමින් සිටියදී පැහැරගෙන යාමක් සම්බන්ධයෙන් පුද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලද තොරතුරක් මත මට්ටක්කුලිය මාර්ගයේදී සැකකරුවන් 04 දෙනෙකු අත්අඩංගවට ගෙන ඇත.

**මෙම සැකකරුවන් වයස අවුරුදු 24,26, 27, හා 32 වයස් වල පසුවන පුදුකුඩිඉරිප්පු, කොටහේන, ඊච්චිලම්පට්ටු හා තෝප්පූර් ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ඉහත සැකකරුවන් අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී ඊච්චිලම්පට්ටු හා තෝප්පූර් ප්‍රදේශ වල පදිංචි සැකකරුවන් දෙදෙනා උතුරු නැගෙනහිර ප්‍රදේශයේ යම් යම් සිද්ධි වලට සම්බන්ධ ආවා නම් කල්ලියේ සාමාජිකයින් දෙදෙනෙකු බවට අනාවරණය කර ගැනීමට හැකි වී ඇත. අනෙක් සැකකරුවන් දෙදෙනා 2024.10.09 වන දින ඩුබායි රටේ සිට ලංකාවට පැමිණ ඇති අතර, මොවුන් ඩුබායි සිටින පුද්ගලයෙකුගේ උපදෙස් මත ඉහත ‘ආවා’ නම් කල්ලියේ පුද්ගලයින් දෙදෙනාව ත්‍රීකුණාමලය ප්‍රදේශයේ සිට මට්ටක්කුලිය ප්‍රදේශයට ගෙන්වා ගෙන ඇති බවට අනාවරණය වී ඇත.

ඉහත ‘ආවා’ නම් කල්ලියේ සාමාජිකයින් දෙදෙනා අන්තර්ජාලය මඟින් ඩුබායි සිටින පුද්ගලයෙකුට ‘Tik Tok’ මඟින් බැන තර්ජනය කර ඇති බවට අනාවරණය කර ගෙන ඇත. එම හේතුව මුල් කරගෙන මෙම සැකකරුවන් දෙදෙනාව කාන්තාවක් මාර්ගයෙන් උපක්‍රමශීලිව මට්ටක්කුලිය ප්‍රදේශයට ගෙන්වා පහරදී වීඩියෝගත කර ඩුබායි සිටින පුද්ගලයෙකුට පෙන්වා ඇති බවට මොවුන්ගේ දුරකථන විශ්ලේෂණයේදී අනාවරණය කරගෙන ඇත.

මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**